## කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පුරප්පාඩු

## පොල් පර්යේෂණ ආයතනය

**පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## තාක්ෂණ නිලධාරී තනතුර - පුරප්පාඩු 05

**වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර :**

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සමග අවම වශයෙන් එකවර විෂයන් හයකින් (6) සමත් වී තිබීම

**සහ**

අ.පො.ස (උසස් පෙළ) විද්‍යා අංශයෙන් අදාල විෂය සංයුතිය සමග එකවර විෂයන් තුනකින් (3) සමත් වීම හා පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු, දෑ අවුරුදු ඩිප්ලෝමාවක් අදාල ක්ෂේත්‍රය සඳහා ලබා තිබීම.

**අභ්‍යන්තර :**

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සමග අවම වශයෙන් එකවර විෂයන් හයකින් (6) සමත් වී තිබීම හා පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමාවක් අදාල ක්ෂේත්‍රය සඳහා ලබා තිබීම සමග ප්‍රාථමික මට්ටමේ (PL) තනතුරක වසර 5 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සේවා අවශ්‍යතා :**

1. තෝරාගනු ලබන අයදුම්කරුවන් හට රසායනාගාරවල මෙන්ම ක්ෂේත්‍රයේ ද කටයුතු කිරීමේ හැකියාව තිබිය යුතුය.
2. යතුරු පැදි පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු වියයුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- වැටුප් කාණ්ඩය : MA 2-2
- වැටුප් පරිමාණය : රු. 30,310/-10X300/-7X350/-4X600/-20X710/-52,360/-
- ආරම්භක වැටුප් තලය : රු. 30,310.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016)
- අනෙකුත් ප්‍රතිලාභ

මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

i ජීවන වියදම් දීමනාව - රු.12,800/-

ii. තේ දීමනාව

**පොදු කොන්දේසි**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි.
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**පොදු ප්‍රතිලාභ**

1. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක| අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත.)
4. පොල් පර්යේෂණ ආයතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ ද හිමිවනු ඇත

අයදුම්කරුවන් විසින් **උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරීගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් අත්සන් කරන ලද තම අයදුම්පත 2024.03.07** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල 61150 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාල සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.cri.gov.lk හි ද පළකර ඇත.

**සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය,**

**ලුණුවිල.**

2024.02.16